
A Story of
Helpless Puppy
(SINHLA)
M.M.CCS.Wijerahne
Written by
G.M.C.. Wijerathne
පුංචි බලු
පැටියෙකුගේ කතාව
සහ තවත් කෙටි කතා
කර්තෘ- චමෝද් සචේතන විජේරත්න

කෘතියේ නම-පුංචි බලු පැටියෙකුගේ කතාව සහ තවත් කෙටි කතා

කර්තෘගේ නම-චමෝද් සචේතන විජේරත්න

කෘතිය පළ කරන දිනය-2025-02-22
*(විද්‍යුත් පොතක් ලෙස)*

කතෘගේ වෙනත් කෘති- *(පළමු ග්‍රන්ථය)*

**ISBN 978-624-208-737-5**

# පිදුම

මාගේ පළමු ග්‍රන්ථ එළිදැක්ම
රස කවි පද වැල් ගෙතූ
අත්තම්මාට

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


| පිටුව | කතාව |
|---|---|
| ☞ 06 | සාස්තරය |
| ☞ 08 | දහයට ගැනීම |
| ☞ 10 | පුංචි බලු පැටියෙකුගේ කතාව |
| ☞ 12 | අධික වේගය |
| ☞ 14 | මාරයා අබියස |
| ☞ 15 | වඳුරා රජ වූ හැටි |

# සාස්තරය

සුමනා එදින තම පුතු සමඟ අසල කඩ මණ්ඩියට ගියේ රෑට කෑමට පාන් ගෙඩියක්වත් රැගෙන ඒමටය. පාන් ගෙඩියක මිල ද රුපියල් හැටකි. කොතරම් අග හිඟකම් තිබුණා ද ඇය තම පුතුට කිසිඳු අඩුපාඩුවක් කළේ නැත. ඒ නිසා ම ඇය දැන් හතර අතට ම ණය වී ඇත. ඇගේ ස්වාමියා ද මේ දුප්පත්කම නැමැති වළෙන් ගොඩ ඒමට හැකි සෑම දෙයක් ම කරයි. නමුත් ඔහුට ද වැඩක් පලක් හමු වන්නේ කලාතුරකින් ය.

"අම්මේ ඉක්මන් කරන්නකෝ" යන හඬින් ඇය කල්පනා ලොවින් අවදි විය. සුපුන් සිටියේ ඇයට අඩි ගණනක් ඈතිනි. ඇය පය ඉක්මන් කර එතැනට ගියා ය. "යමු පුතේ, පාන් කන්න පරිප්පු හොද්දක්වත් හදා ගන්න එපෑය" යි කියූ ඇය කඩ මණ්ඩිය දෙසට ගියා ය.

සුපුන් මේ වසරේ ශිෂ්‍යත්ව විභාගය ලියන්නට සූදානම්ව සිටී. කිසිඳු අමතර පන්තියක් නොමැති වුව ද ඔහු හොඳින් තම අධ්‍යාපන කටයුතුවල නිරත වෙයි. එමෙන් ම පාසලේ සෑම විභාගයකදී ම පන්තියේ පළමු තැනට පත් වෙයි. පවුලේ ඇති අග හිඟකම් හොඳින් දන්නා සුපුන් දෙමව්පියන්ට වැඩි බරක් නොදී සිටින අහිංසක ළමයෙකි.

මෙවැනි දේ සිතමින් ගමන් කළ සුමනා අවසානයට පාන් කඩයට ළඟා විය. "පුතේ, පාන් ගෙඩියක් අරන් වරෙන්"යැයි කියූ සුමනා සුපුන් අතට මුදල් දුන්නේ තමා කඩයට ගියහොත් ලුණු ඇඹුල් ඇති ව මුදලාලිගෙන් බැණුම් ඇසිමට සිදුවන බැවිනි. ඔවුන් නිතර ම වාගේ පාන් ගන්නේ පොතටය.

පාන් රැගෙන යන අතරමඟ දී ඇයට සාස්තරකාරයෙක් හමු විය. ඇයට බොහෝ දිනක සිට සාස්තරයක් ඇසීමේ අවශ්‍යතාවක් තිබිණි. එමනිසා ඇය සාස්තරකාරයා අසලට ගියේ ය.

"කීය ද සාස්තරයක්?" සුමනා සාස්තරකාරයාගෙන් ඇසී ය. "සීයයි නෝනා සීයයි. අද,හෙට,අනිද්දා,ලබන අවුරුද්දේ, ලබන ආත්මේ හැමදේම කියනවා නෝනා රුපියල් සීයට" සාස්තරකාරයා දිග වැල්වටාරමක් ගෙන හැර පෑවේ ය.

ඇය සතුව තිබුණේ රුපියල් සියයක් ම පමණි. එය තම දරුවා වෙනුවෙන් වැය කළ යුතුයැයි ඇය සිතුවා ය. "මේ ළමයගෙ සාස්තරයක් බලන්නකො එහෙනම්" සුමනා කීවා ය.

සාස්තරකාරයා සුපුන්ගේ අත ගෙන බැලීය. "කීයෙද මේ ළමයා?" යැයි සුළු මොහොතකට පසු සුමනාගෙන් ඇසී ය. "පහ වසරෙ"යැයි ඇය පිළිතුරු දුනි. "ඒක තමයි නෝනා. මේ ළමයට පොඩි අපලයක් තියෙනවා. ළඟ ම තියෙන තරඟ විභාගයෙන් මේ ළමයා අසමත් වෙනවා"යැයි සාස්තරකාරයා කීය.

මහත් සේ වෙහෙස වෙමින් ශිෂ්‍යත්ව විභාගයට පාඩම් කරන සුපුන් කෙසේ අසමත් වන්නදැයි ඇයට සිතුනි. නමුත් සාස්තරකාරයා කියන දේ වැරදි විය නොහැකි බව සුමනාට සිතිණි.

"මොකුත් කරන්න බැරි ද මේකට?" ඇය ඇසීය. "කරන්නනම් දෙයක් තියෙනවා හැබැයි ගාණනම් ටිකක් සැරයි නෝනා"යැයි සාස්තරකාරයා කීය. "කමක් නැහැ, කියන්නකෝ බලන්න"යැයි සුමනා කීය. "විශ්ව භාරතී කල්කය දවස් තුනක් එකදිගට ගිල්ලනම් හරි. හැබැයි දාහක් විතර යයි." යැයි කීය. "කමක් නැහැ." යැයි පිළිතුරු දුන් සුමනා තම අත වූ මුදුව ගලවා සාස්තරකාරයාට දුන්නේ ය. "හරි නෝනා හෙට උදේ මෙතනට එන්නකෝ"යැයි කියූ සාස්තරකාරයා යන්නට ගියේ ය.

එදා රාත්‍රියේ ආහාරය ගන්නා අතර උදේ සිදු වූ සිදුවීම සිය ස්වාමියා වූ සුමනදාසට කීය. "ඔය කොට,මහත,කොණ්ඩෙ බොකුටු මිනිහෙක් ද?"යැයි සුමනදාස පුදුමයෙන් ඇසීය. "ඔව්, ඇයි?"සුමනා ඇසීය. "ඔය මනුස්සයා අලි හොරෙක්. ආය ඔය මිනිහා හොයාගන්න වෙන්නේ නෑ" සුමනදාස කීය. "ඔයා කොහොමද එහෙම කියන්නේ?"සුමනා පුදුමයෙන් ඇසීය. "ඒ මිනිහා ළඟදී මං මේසයක් ගෙනිච්ච ගෙදර නෝනටත් සුද්දෙ දීලා තිබුණා"යැයි සුමනදාස කීය.

ඇය පසු දින ගමෙහි හා අසල නගරයේ සෑම තැන ම සෙව්වත් ඒ සාස්තරකාරයා සොයාගත නොහැකි විය. නැවත ඔහු පිළිබඳ කිසිඳු ආරංචියක් ලැබුණේ නැත.

✸✸✸✸

# දහයට ගැනීම

පසිඳු තවම එක වසරෙහි ඉගෙනුම ලබන ළමයෙකි. ඔහුගේ දෙමව්පියන් බොහෝ වෙහෙස මහන්සි වූ අතර මුදලින් ම ඔවුන්ට ලක්ෂයක් පමණ ගෙවීමට සිදු විය. එසේ වියදම් කළ මුදලට කිසිඳු පාඩුවක් නොකළ පසිඳු තමාට හැකි පමණට ඉගෙන ගත්තේ ය. ඔහුගේ දෙමව්පියන්ට එය වෙලාවකට හොඳටම ඇති වූ අතර වෙලාවකට කිසිඳු කමකට නැති විය.

පසිඳුගේ ගුරුතුමිය ද බොහෝ සැර පරුෂ කාන්තාවක් වූ අතර ළමුන්ට කිසිඳු අනුකම්පාවක් නොදැක්වීය. ළමුන්ට අකුරක් හෝ බැරි වුවහොත් ඇය දරුවාගේ දෙමව්පියන්ට දුරකතන ඇමතුමක් ගෙන බැණ වදී. නමුත් කිසි දිනෙක පසිඳුගේ නිවසට දුරකතන ඇමතුමක් නාවේ ඔහුගේ දෙමව්පියන් හෙට තිබෙන දේ අද පුරුදු කර යවන නිසා ය. එමනිසා පසිඳු ගුරුතුමියගේ නිබඳ පැසසුමට ලක් විය. ගුරුතුමිය සෑම විටම පැවසුවේ සැවොම පසිඳු ආදර්ශයට ගත යුතු බවයි.

නමුත් දිනක් පසිඳුගේ නිවසට ද දුරකතන ඇමතුමක් ආවේ ය. " අනේ බලන්නකෝ පසිඳුගේ අම්මා, පසිඳුට දහයට ගණින්න බෑනේ. කොහොමද මම දැන් මේ පාඩම ඉස්සරහට කරගෙන යන්නේ. මේ තරම් දක්ෂ ළමයෙක් වෙලත් පසිඳුට තාම දහයට ගැන ගන්න බැරි නම් වැඩක් තියෙනව ද පසිඳුගෙ අම්මේ?"යැයි ගුරුතුමිය පසිඳුගේ මවට කීය. පසිඳුගේ මව තරහට ම දුරකතන ඇමතුම විසන්ධි කළා ය.

පාසල නිම වී බසයෙන් බැස නිවසට පැමිණි පසිඳු මව තරයේ අල්ලා ගත්තේ ය. " තමුසෙට දහයට ගණින්න බැරි මොකද?"යැයි පසිඳුගේ මව ඇසීය. "මම ගැන්නා. අට අමතක වුණා" යැයි පුංචි පසිඳු ගොත ගසමින් කීය. "අටත් අමතක වෙන ඉලක්කමක් ද?"යැයි ඇසූ පසිඳුගේ මව අසල තිබූ කෝටුවක් ගෙන පසිඳුට හොඳටම ගැසුවා ය. පසිඳු අඬාගෙන ගොස් නිදන්නට විය.

පසිඳුගේ පියා සවස හතරට පමණ නිවසට ආවේ ය. "කෝ පසිඳු?" ඔහු ඇසීය. "අර ඉන්නේ"පසිඳුගේ මව තරඟින් මෙන් කීය. "මොකද වුණේ?"පසිඳුගේ පියා ඇසීය. "ඒ මෝඩයට දහයට ගැණගන්න බැහැනෙ කියන්නේ"මව කීය. "ඉතින්?"පියා ඇසීය. "මම අල්ලගෙන දුන්නා හොඳ පාරක්"මව කීය. "එහෙම කරන්න එපා සමනලී. ඒගොල්ලො තාම පොඩි ළමයිනේ"කියූ පියා පසිඳු අසලට ගොස් ඔහු අවදි කරන්නට උත්සාහ කළේ ය. නමුත් එය පසිඳුගේ අවසන් නින්ද විය. යලි ඔහු කිසි දිනෙක අවදි වූයේ නැත.

✸✸✸✸

# පුංචි බලු පැටියෙකුගේ කතාව

දිනක් මා පාරේ ගමන් කරන විට මට පාරේ පසෙක අසරණ ව සිටි බලු පැටියෙක් සමු විය. ඒ සතාට හොඳහැටි තුවාල වී ඇති බව මම දුටුවෙමි. මම වහාම එම බලු පැටියා නිවසට ගෙන ගියෙමි.

ඇඟ පුරා ඇති වී තිබූ තුවාලවලට ප්‍රතිකාර කර හාමතේ සිටි බලු පැටියාට බීමට කිරි වීදුරුවක් තැබුවෙමි. මම සාලයට ගොස් පොතක් බලමින් සිටින අතර "මහත්තයා" යැයි හඬක් ඇසිණි. වටපිට බලන විට මම දුටුවේ මා අසල වැතිරී සිටන බලු පැටියාය.

"බලු පැටියෝ..."මම බලු පැටියාට කතා කළෙමි. "ඔව් මහත්තයා කියන්න.මම තමයි මහත්තයාට කතා කළේ"යැයි බලු පැටියා කියනු ඇසී මම පුදුමයට පත් වුණෙමි. නමුත් පුදුමය මඟහරවා ගනිමින් ම මම"මොකද බලු පැටියෝ ඔයා මට කතා කළේ?"යැයි ඇසීමි. "මහත්තයා මට ගොඩක් උදවු උපකාර කළා. මම දන්නවා ඔබතුමා ඒවා කළේ හිතේ සතුටින් කියලා. ඉතින් මට හිතුණා මගේ කතාව ඔබතුමාට කියලා මගේ හිත සැහැල්ලු කරගන්න"යැයි බලු පැටියා කීය. "හා... ඒකත් එහෙමද? එහෙනම් කියන්න බලන්න"යි කීයූ මම පුටුවේ හරිබරි ගැහී වාඩි වුණෙමි.

"මහත්තයෝ මම ඉපදුණු දවසේ ඉඳන් ජීවත් වුණේ මහත්තයා මාව අහුලගත්ත තැන එහා පැත්තේ තිබුණ ඉස්කෝලේ. මගෙ අම්මා මම ඉපදිලා මාසෙක්න් මැරුණා මහත්තයෝ. මම ඉස්කෝලේ ළමයි විසිකරන කෑම කාලයි ජීවත් වුණේ. ඒ වුණාට මහත්තයෝ මට කවදාවත් ඒ ඉස්කෝලේ නිදහසේ ජීවත් වෙන්න බැරි වුණා. ඒ ඉස්කෝලේ ළමයි සෙල්ලම් කරන්න බෝලයක් නැති වෙලාවට බෝලයක් විදිහට පාවිච්චි කළේ මාව. එකපාරක් ඒ ළමයි මගේ අත් දෙක මේස ලාච්චුවකට හිර කරලා මාව එල්ලලා තිබ්බා මහත්තයෝ. තවත් දවසක් ළමයෙක් බ්ලේඩ් තලේකින් මගෙ ඔළුවේ මස් කෑල්ලක් ම කපලා අයින් කළා මහත්තයෝ... මහත්තයා ඒකට සාත්තු කරපු නිසා හොඳයි. ඊට පස්සෙ මහත්තයෝ මාව දැකපු

විදුහල්පති මහත්තයා 'මේ මොන මුස්පේන්තු බල්ලෙක් ද? අල්ලා දානවා මේකා එළියට' කියලා මිනිස්සු වගයක් ගෙන්නලා මාව ඉස්කෝල වැටෙන් එළියට විසි කළා මහත්තයෝ. මාව කෙළින්ම වැටුණේ කුණු කාණුවට. මම බොහොම අමාරුවෙන් ඒකෙන් ගොඩ වුණේ. ඒත් මට දැනෙනවා මගෙ ඔළු කට්ට කැඩිලා කියලා. මට කැරකිල්ල වගේ. මහත්තයා... මම තව දවස් දෙක තුනකින්..." එය එම අසරණ බලු පැටියාගේ අවසන් වදන් පෙළ විය. මම සරල චාම් අවමංගල උත්සවයක් පවත්වා බලු පැටියාගේ දේහය ආදාහනය කළෙමි. මට එදා සිතුනේ මෙවැනි අසරණ සතුන් පමණක් නොව මිනිසුන් ද ලොව පුරා සිටින බවය.

✸✸✸✸

# <u>අධික වේගය</u>

පාරේ අධික වේගයෙන් ධාවනය වන කාර් රථයකි. පාරේ ගමන් කරන වාහන කිහිපයකම ගැටෙන්න ගිය මෙම වාහනය නවතා ගැනීමට කිසිඳු පොලිස් නිලධාරියෙකුට නොහැකි විය. මෙම කාර් රථය පිළිබඳ පැමිණිලි ලැබී තිබුණි. තම රාජකාරියක් සඳහා ගමන් කරමින් සිටි පොලිස් පරීක්ෂකවරයෙකු වන නිමල් අධික වේගයෙන් පැමිණෙන මෙම වාහනය ඉතා අමාරුවෙන් නවතා ගත්තේ ය.

"කොහෙද මහත්තයා මේ යන්නේ? මහත්තයා ගැන පැමිණිලි ගොඩක් අපිට ලැබිලා තියෙනවා" නිමල් පොලිස් නිලධාරිවරුන් සතු ගාම්භීර බව පවත්වා ගනිමින් ඇසීය. "අනේ මහත්තයෝ මගෙ දුව වාහනේක හැප්පිලා. ඉක්මනට ඉස්පිරිතාලෙට ගෙනියන්න ඕනේ" වාහනයේ රියදුරා පැවසීය.

නිමල් වාහනයේ පිටුපසට එබී බැලීය. නිමල් දුටු දෙයින් ඔහුගේ හද කම්පාවට පත් විය. වයස අවුරුදු පහක් පමණ වන දැරියකගේ කකුලේ විශාල තුවාලයකි. මුළු ආසනයම ලෙයින් වැසී ඇත. නිමල්ට තීරණයක් ගැනීමට ගත වූයේ සුළු මොහොතකි.

"යමු මහත්තයා"නිමල් වාහනයේ රියදුරාට කීය. "අනේ මහත්තයා මම දුවව ඉස්පිරිතාලෙට දාලා අනිවාර්යයෙන්ම පොලිසියට එනවා. මම පොරොන්දු වෙනවා" වාහනයේ රියදුරා පැවසීය. "පොලිසියට නෙවෙයි මිනිහෝ,ඉස්පිරිතාලෙට"නිමල් කීය. "අනේ බොහොම ස්තුතියි මහත්තයා"යි කියූ රියදුරු වාහනය පණ ගැන්වීය.

පාරේ සිටි පොලිස් නිලධාරීන් සියල්ලෝම පුදුමයෙන් මෙන් බලා සිටියේ පොලිස් පරීක්ෂකවරයෙකු සාමාන්‍ය,පැමිණිලි ලද කාර් රථයක් පෙරටු කරගෙන යන ආකාරයය. තව ද වාහන දෙකම අධික වේගයෙන් ගමන් කරන ආකාරය ය. නමුත් පොලිස් පරීක්ෂකවරයෙකු සිටින නිසා ඔවුන්ට කිරීමට ද කිසිඳු දෙයක් නැත.

ඔවුන් කෙසේ හෝ රෝහලට පැමිණියහ. දියණියට කිසිඳු කරදරයක් නැති බව වෛද්‍යවරයා විසින් දැන්වීය. "අනේ බොහොම ස්තුතියි මහත්තයා. මහත්තයා නිසා මගෙ දුවගෙ ජීවිතය බේරුණා. බොහොම ස්තුතියි මහත්තයා" වාහනයේ රියදුරා පොලිස් පරික්ෂකවරයාට පැවසීය. "ඒක මගෙ යුතුකම මහත්තයා. ඔයත් මනුස්සයෙක්,මමත් මනුස්සයෙක්" පොලිස් පරික්ෂකවරයා කීය. මෙවැනි මිනිසුන් සැම තැනම සිටිනවා නම් ලෝකය කොතරම් සුන්දරදැ යි වාහනයේ රියදුරුට සිතුණි.

✹✹✹✹

# භාර්යා අභියස

සුමන ලෙඩ ඇඳට වැටී දැන් මාස ගණනක් ගත වී ඇත. වෙද මහත්තයා නම් කියන්නේ කොයික කළත් බේර ගන්නට බැරි බවය. නමුත් නෑදෑයෝ නම් වීරිය කරන්නේ සුමන බේරා ගන්නටය. දොස්තර මහතා කියූ පරිදි බටයකින් සුමනට දැන් දිනපතා තුන් වේල කන්න බොන්න දෙයි. නමුත් සුමනට කිසිම ගුණයක් නැත. අඩු ම ගණනේ ඇහැක් ඇර බලන්නේවත් නැත.

නමුත් සුමනගේ දරුවන් නම් බලා සිටින්නේ ම ඔහු මැරෙන තුරු ය. ඒ ඔවුන්ට ඇති කරදරයෙන් බේරීමටත් පියාගේ දේපළ අත්පත් කර ගැනීමටත් ය. සුමනගේ ළඟ ම නෑදෑයන් මෙය දැන සිටියත් ඒ බව නොපෙන්වූයේ තමාටත් දේපළින් කොටසක් හිමිවන බව දැනගෙන ම ය.

මෙසේ කාලයක් ගත විය. සාත්තු සප්පායම් කළ අයට ද දැන් එය එපා වී ඇත. දරුවන්ට ද පියා ජීවත් වීම මහා හිස රදයකි. එම නිසා සියල්ලෝ ම එකතු වී සුමන මිය ගියා යැයි සලකා ආදාහනය කිරීමට තීරණය කළහ.

සුමනගේ අවමංගල උත්සවය ඉතා උත්කර්ශවත් ලෙස පැවැත්විය. බොහෝ දෙනා කීවේ ඒ ආකාරයේ මංගල උත්සවයක්වත් ඔවුන් දැක නැති බවය. අවමංගල උත්සවයට දාහකට අධික පිරිසක් පැමිණ සිටියහ. නමුත් එහි සිටි බොහෝ දෙනෙක් සත්‍ය සිදුවීම දැන සිටියේ නැත.

අවමංගල උත්සවය අවසන් වී ටික දිනකට පසු සුමනගේ දරුවන් සුමනගේ නීතීඥයා හමුවීමටය. ඒ සුමනගේ දේපළවලින් තමාට හිමි කොටස ලබා ගැනීම සඳහා ය. නමුත් සිදුව තිබුණේ අනිකකි. සුමනගේ අන්තිම කැමති පත්‍රය අනුව සියලු දේපළ වැඩිහිටි නිවාසයකට ලියා තිබුණි.

✸✸✸✸

# <u>වඳුරා රජ වූ හැටි (ප්‍රබන්ධයකි)</u>

එක්තරා කුඩා දූපතක සෘෂිවරයෙකු සිටියේ ය. දහසකුත් එකක් කරුණු දැන සිටි ඔහුගෙන් ඉගෙන ගැනීමට අන් දූපත්වලින් බොහෝ මිනිස්සු පැමිණියහ. එසේ පැමිණි මිනිසුන් අතර වනාන්තර බහුල එක්තරා දූපතකින් පැමිණි තරමක පණ්ඩිතයෙකු වූ මිනිසෙකු සිටියේ ය. ඔහු පැමිණි වහා ම සෘෂිවරයා හමුවට ගොස් මෙසේ කී ය.

"ඇඳුරුතුමනි, මා වනාන්තර බහුල පෙදෙසක වෙසෙන්නෙක්මි. මා හට සත්ත්ව භාෂාව උගන්වනු මැනවි. එවිට මා හට සතුන්ට අපේ අධ්‍යාපනය ලබා දිය හැක."

එයට පිළිතුරු දුන් ඇඳුරුතුමා "ප්‍රිය ශිෂ්‍ය, සත්තව භාෂාව ඔබ හට ඉගැන්වීම මා හට අසීරු කරුණක් නොවේ. නමුදු සතුන්ට අපේ අධ්‍යාපනය ලබා දීම නුවණට සුදුසු කරුණක් නොවේ."

ඇඳුරුතුමා කොපමණ පැහැදිලි කළ ද ශිෂ්‍යයා එම කරුණු කනකටවත් නොගෙන සත්ත්ව භාෂාව උගන්වන ලෙස ඇවටිලි කළේ ය. අවසානයට සෘෂිවරයාට කළ හැකි දෙයක් නොවූ බැවින් සත්තව භාෂාව ඉගැන්වීමට තීරණය කළේ ය.

එම ශිෂ්‍යයාට ඉගැන්වීමේ දී සෘෂිවරයාට වැටහුණු කාරණය නම් ඔහුට කියන දේ එසැණින් මතක තබා ගත හැකි බවයි. නමුත් ඔහුගේ ප්‍රායෝගික දැනුම ඉතා අවම විය. එවැනි ප්‍රායෝගික කරුණු ඔහුට පැහැදිලි කිරීමට හරස් වූයේ ඔහුගේ අධික පණ්ඩිත භාවයයි. කෙසේ නමුත් එම ශිෂ්‍යයා තම ඉගෙනීම අවසන් කර නැවත තම දූපත කරා ගියේ ය.

තම දූපතට ගිය වහා ම  මාස ගණනකට සරිලන සේ අහාර පාන හා බඩු මුට්ටු ද රැගෙන වනාන්තරය කරා ගියේ ය; තම සත්තව දැනුම භාවිතා කර පහත පණිවිඩය සතුන්ට කීය.

"මම මෙම වනාන්තරයට පැමිණියේ ඔබ සියලු දෙනාට ම ඉදිරි ජීවිතයට වැදගත් වන අධ්‍යාපනය ලබා දීම සඳහා යි. අද සිට ඔබලා සියලු දෙනා මාගේ ශිෂ්‍යයන් වනු ඇති."

මෙය ඇසුණු සිංහයා මෙසේ ඇසීය."ඔබ කගේ අණ අනුව ද මෙහි පැමිණියේ?"
සත්‍ය පැවසුවහොත් වැඩ වරදින බව දැන ගත් ශිෂ්‍යයා "මා පැමිණියේ සක්‍රයාගේ පුත් වයිමාගේ අණ අනුවයි" යනුවෙන් පැවසීය.

මෙය කන වැකුණු සතුන් ඉතා ගරු හරසරින් යුතුව ඔහු පිළිගත්තේ ය. එම ශිෂ්‍යයා ද ගරු බහුමානයට කැමති බැවින් එය ඉවසුවේ ය. මේ අතර මෙම සිදුවීම දුටු සක්‍රයා තම පුතු හමුවට ගොස් මෙය පිළිබඳ විමසීය. එයින් පුදුමයට හා කෝපයට පත් වයිමා වහා ම ගොස් එම ශිෂ්‍යයා විනාශ කිරීමට සැරසුණේ ය. නමුත් සක්‍රයාගේ අදහස වූයේ ඔහුට අවස්ථාව දී බලා සිටිය යුතු බවයි. තම පියාගේ වචනයට පිටින් යා නොහැකි වූ වයිමා නිහඬ විය.

මේ අතර ශිෂ්‍යයා විසින් සතුන්ට ශිල්ප ඉගැන්වීම ආරම්භ කළේ ය. ඔහුගේ මුල් ම පාඩම වූයේ පිහිනීමයි. අසල ඇති ගංගාව වෙත ගිය ඔහු සතුන්ට එයින් පිහිනා එගොඩ වන ලෙස කීය. බොහෝ සතුන් අකැමැත්තෙන් වුව ද ගඟ තරණය කළේ එය වයිමාගේ අණ වූ බැවිනි. අපොයි! අසරණ කුහුඹුවාත්, මීයාත්, ලේනාත් ගං දියට අසු වී නොපෙනී ගියේ ය. මීළඟ පාඩම වූයේ ගස් නැගීමයි. සතුන් කිහිප දෙනෙක්ට ගසට නැග ගැනීමට නොහැකි වෙද්දී සිංහයාත්, කොටියාත්, වඳුරාත් ගසට නැග ගත්තෝ ය. මීළඟට තිබූ පාඩම නම් ගසින් ගසට පැනීමයි. කොටියා ගසෙන් වැටී මිය යද්දී, සිංහයා තමාට නොහැකි බව පවසා බැස යද්දී, වඳුරා සාර්ථකව ගසෙන් ගසට පැන ගියේ ය. සියලු සතුන් මෝඩයන් බවත්, වඳුරා තරමක හෝ දක්ෂයෙකු බවත් පැවසූ එම ශිෂ්‍යයා වඳුරා කැලයෙහි රජකමට පත් කර යන්නට ගියේ ය.

මේ සියල්ල සිදු වීමට මනු ලොව මාස ගණනක් ගත වී තිබුණ ද දෙව් ලොව ගත වී තිබුණේ වරුවක පමණ කාලයකි. වනාන්තරයේ සිදු වූ සියල්ල දිවැසින් දුටු වයිමා ගොස් තම පියාට දොස් පවරන්නට විය. එයට පිළිතුරු දුන් සක්‍රයා පැවසුවේ වඳුරාට ද අවස්ථාවක් දිය යුතු බවයි.

මෙසේ කාලය ගත විය. වඳුරා රජකමට පත් වූ පසු පළමුව කළේ සතුන්ට ගස් නැගීමට හා ගසින් ගසට පැනීමට කියා දීම යි. මෙහි දී ගසින් බිමට ඇද වැටී බොහෝ සතුන් මිය

ගියෝ ය. අවසානයට කැලයේ ඉතිරි වූයේ සිංහයාත්, උගුරු මීයාත්, කැළෑ බළලාත් පමණි. අනතුරුව වඳුරා තවත් දරුණු නීතියක් පැනවීය. එනම් මස් මාංශ භාවිතය තහනම් කිරීමයි. මෙය කණ වැකුණු සැණින් සිංහයා ගොස් වඳුරාව අල්ලා ගත්තේ ය. අහෝ! වඳුරාගේ රාජ සමය එසේ අවසන් විය.

මේ දේ සිදුවීමට දෙව් ලොව ගත වී තිබුණේ හෝරා කිහිපයකි. මෙය දුටු වයිමා තම පියාටවත් දැනුම් නොදී වනාන්තරයට ගොස් සියලු සතුන් නැවත මවා සිංහයාට රජකම පැවරීය. සතුන්ට වයිමා කුඩා දරුවෙකු මෙන් පෙනුණ නිසා ඔවුන් වයිමා මහ බබා ලෙස හඳුන්වන්නට විය. එම වචනය මිනිසුන් අතරට එන විට මහ බාඹා ලෙස වෙනස් විය.

✷✷✷✷

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්